ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

***

**ශ්‍රී ලංකා ජනාධිපතිතුමාගේ ඉන්දීය සංචාරය අතරතුර අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් සිදු කරන ලද මාධ්‍ය ප්‍රකාශය**

**අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමනි,**
**රටවල් දෙකෙහිම නියෝජිතයනි,**
**සියළු මාධ්‍ය මිතුරනි,**
**ආයුබෝවන්!**
**වණක්කම්!**

මා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ එතුමාගේ නියෝජිත පිරිස ඉන්දියාවට සාදරයෙන් පිළිගන්නවා. අද දින ජනාධිපති වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති ධුරයට පත්ව වසරක් සපිරෙනවා. ඒ සම්බන්ධයෙන් මා, අප සියලු දෙනා වෙනුවෙන් එතුමාට හෘදයාංගම සුබ පැතුම් පිරිනමනවා. පසුගිය වසර ශ්‍රී ලංකාවේ ජනතාවට අභියෝග පිරුණු වසරක් වුණා. සමීප මිතුරකු වශයෙන්, අප සැමවිටම මෙන්, මෙම අර්බුදකාරී සමයේ දී ශ්‍රී ලංකාවේ ජනතාව සමඟ උරෙනුර රැඳී සිටියා. මෙම අභියෝගාත්මක අවස්ථාවන්ට මුහුණ දීමේ දී ශ්‍රී ලංකා ජනතාව පිළිඹිබු කළ ධෛර්යයට මා හෘදයාංගමව සුබ පතනවා.

**මිත්‍රවරුනි,**

අප සබඳතා අපගේ ශිෂ්ටාචාර තරම්ම ඉපැරණි යි, පෘථුල යි. ශ්‍රී ලංකාවට ඉන්දියාවේ “අසල්වැසියා ප්‍රථමයෙන්” සහ “SAGAR” යන දැක්මන් දෙකෙහිම වැදගත් තැනක් හිමි වෙනවා. අද දින අප ද්විපාර්ශවික, කලාපීය සහ ජාත්‍යන්තර කරුණු පිළිබඳව අපගේ අදහස් හුවමාරු කර ගත්තා. ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ආරක්ෂක අභිලාෂයන් සහ සංවර්ධනය එකිනෙක හා බැඳී තිබෙන බව අප විශ්වාස කරනවා. එබැවින්, එකිනෙකාගේ ආරක්ෂාව සහ සංවේදිතා සිතෙහි තබා ගනිමින් එක්ව කටයුතු කිරීම අනිවාර්ය වෙනවා.

**මිත්‍රවරුනි,**

අද දින අප අපගේ ආර්ථික හවුල්කාරිත්වය සඳහා දැක්මක් ප්‍රකාශයට පත් කළා. මෙම දැක්මේ අරමුණ වන්නේ සමුද්‍රීය, ගුවන්, බලශක්ති සහ දෙරට ජනතාව අතර සම්බන්ධකතාවය ශක්තිමත් කිරීමයි. මෙම දැක්මේ අරමුණ වන්නේ සංචාරක කර්මාන්තය, විදුලි බලය, වෙළඳාම, උසස් අධ්‍යාපනය සහ කුසලතා සංවර්ධනය යන ක්ෂේත්‍රවල අන්‍යෝන්‍ය සහයෝගීතාවය වේගවත් කිරීමයි. ශ්‍රී ලංකාව වෙනුවෙන් ඉන්දියාවේ දිගු කාලීන කැපවීම මෙම දැක්ම යි.

**මිත්‍රවරුනි,**

ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම පිළිබඳ සාකච්ඡා කඩිනමින් ඇරඹීමට අප තීරණය කර තිබෙනවා. මෙය දෙරටටම වෙළඳ සහ ආර්ථික සහයෝගිතාවයේ නව ශක්‍යතාවයන් විවර කරනු ඇති.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ගුවන් සම්බන්ධකතාවය ඉහළ නැංවීමට අප එකඟ වුණා. ව්‍යාපාර සහ ජනතාවගේ සංචරණ ඉහළ නැංවීම සඳහා තමිල් නාඩුවේ නාගපට්ටිනම් සිට ශ්‍රී ලංකාවේ කන්කසන්තුරෙයි අතර මගී ප්‍රවාහන බෝට්ටු සේවා ආරම්භ කිරීමට ද තීරණය කර තිබෙනවා.

දෙරට අතර විදුලිබල ජාල සම්බන්ධ කිරීමේ කටයුතු කඩිනම් කිරීමට අප තීරණය කර තිබෙනවා. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පෙට්‍රෝලියම් නළයක් ඉදි කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කෙරෙනු ඇති. මෙයට අමතරව ගොඩබිම් පාලමක් සඳහා ද ශක්‍යතාවය සොයා බැලීමට තීරණය කෙරුණා. ශ්‍රී ලංකාව තුළ UPI හඳුන්වාදීමට අද දින අත්සන් තැබුණු ගිවිසුමත් සමඟ මූල්‍ය තාක්ෂණ සම්බන්ධකතාවය ද ඉහළ නැංවෙනු ඇති.

**මිත්‍රවරුනි,**

අද දින අප ධීවරයන්ගේ ජීවනෝපාය හා සම්බන්ධ කරුණු ද සාකච්ඡා කළා. මේ සම්බන්ධයෙන් අප මානුෂීය ප්‍රවේශයකින් කටයුතු කළ යුතු බවට අප එකඟ වුණා. අප ශ්‍රී ලංකාවේ යළි ගොඩනැගීම සහ සංහිඳියාව පිළිබඳව ද සාකච්ඡා කළා. ජනාධිපති වික්‍රමසිංහ මැතිතුමා එතුමාගේ අන්තර්ග්‍රහණීය ප්‍රවේශය පිළිබඳව මා දැනුවත් කළා.

ශ්‍රී ලංකා රජය දමිළ ජනතාවගේ අභිලාෂයන් ඉටු කරනු ඇතැයි ද සමානාත්මතාවය, යුක්තිය සහ සාමය උදෙසා යළි ගොඩනැගීමේ ක්‍රියාවලිය ප්‍රේරණය කරනු ඇතැයි ද 13 වන ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීමට කැපවීම ඉටු කරනු ඇතැයි ද පළාත් සභා මැතිවරණය පවත්වනු ඇතැයි ද ශ්‍රී ලංකාවේ දමිළ ප්‍රජාව සඳහා ගෞරවාන්විත සහ අභිමානවත් ජීවිතයක් සහතික කරනු ඇතැයි ද අප අපේක්ෂා කරනවා.

**මිත්‍රවරුනි,**

මෙම වසර අපගේ ද්විපාර්ශවික සබඳතා සම්බන්ධයෙන් සුවිශේෂී වසරක්. අප රාජ්‍යතාන්ත්‍රික සබඳතාවල 75වන සංවත්සරය සමරනවා. ඉන්දියානු සම්භවයක් ඇති දමිළ ප්‍රජාව ශ්‍රී ලංකාවට පැමිණ වසර 200ක් ද මෙම වසරේදී සම්පූර්ණ වෙනවා. ශ්‍රී ලංකාවේ ඉන්දියානු සම්භවයක්

ඇති දමිළ පුරවැසියන් වෙනුවෙන් රුපියල් කෝටි 75ක් වටිනා විවිධ ව්‍යාපෘති ක්‍රියාවට නැංවෙනු ඇති බව මා මෙම අවස්ථාවේ දී සතුටින් ප්‍රකාශ කරනවා. මෙයට අමතරව, ඉන්දියාව ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල සංවර්ධන වැඩසටහන් සඳහා ද දායකත්වය ලබා දෙනු ඇති.

**ජනාධිපතිතුමනි,**

ස්ථාවර, සුරක්ෂිත සහ සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් ඉන්දියාවේ පමණක් නොව සමස්ත ඉන්දියානු සාගර කලාපයේම සුබ සිද්ධියට ඉවහල් වෙනවා. ඉන්දියාවේ ජනතාව මෙම දුෂ්කර අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ ජනතාව සමඟ සිටින බවට මා නැවතත් සහතික වෙනවා.

**බොහොම ස්තුතියි!**

*******

**කොළඹ**
**2023 ජූලි 21**